ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

නිවේදන අංක: HRC/A/i/S/01/05/24

**නිවේදනයයි**

**තේමාත්මක උප කමිටු නැවත පිහිටුවීම**

වර්ෂ 2016, විශේෂිත මානව හිමිකම් අභියෝග කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තේමාත්මක උප කමිටු පිහිටුවන ලදී.

මෙම උප කමිටු මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරු විසින් සභාපතිත්වය දරන ලද අතර සිවිල් සමාජ සංවිධානයන්හි නියෝජිතයන්, මානව හිමිකම් ආරක්ෂකයින් තේමාත්මක විශේෂඥයින් සහ ශාස්ත්‍රඥයින් ඇතුළත් වේ.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වර්ෂ 2024 දී මෙම තේමාත්මක උප කමිටු නැවත පිහිටුවීමට තීරණය කර ඇත.

ඒ අනුව පහත තේමා පාඨයන් කෙරෙහි අවධානය යොමු කරමින් නව උප කමිටු අටක් පිහිටුවා ඇත. එම තේමාවන් අට පහත පරිදි වේ.

1. පුද්ගලික නිදහස
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික දිශානතිය සහ ,ලිංගික අනන්‍යතාවය
3. ළමා අයිතිවාසිකම්
4. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
5. සමාජ - ආර්ථික අයිතිවාසිකම්
6. ආබාධ සහිත පුද්ගලයින්
7. ‘මලයහ’ දමිළ ප්‍රජාව ( කඳුකර දෙමළ ප්‍රජාව)
8. ව්‍යාපාර හා මානව හිමිකම්

**සංයුතිය**

සෑම උප කමිටුවක්ම පහත පරිදි සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත වේ.

---

[1] මෙම තේමාවෙන් වධහිංසා පැමිණවීම, භාරකාරීත්වයේදී සිදුවන මරණ, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් වැනි ගැටලු ආවරණය කරයි.

2. මෙම තේමාවෙන් සේවකයන්ගේ අයිතිවාසිකම්, මානව හිමිකම් උල්ලංඝනය, කම්කරු ප්‍රතිසංස්කරණ, සංවර්ධන ව්‍යාපෘතිවල සහ පාරිසරික ගැටලු

- වාර්තාකරු:- මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂකවරයෙක් විය යුතුයි.
- විශේෂිත තේමාවන් යටතේ සේවය කරනු ලබන සිවිල් සංවිධාන නියෝජිතයන් සය දෙනෙකු. සහ
- තේමාත්මක විශේෂඥයන් දෙදෙනෙකු.

මානව හිමිකම් කොමිෂන් සභාවේ අදාළ කාර්ය මණ්ඩල නිලධාරීන් ද ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වනු ඇත.

**නාමයෝජනා ක්‍රියාවලිය**

සිවිල් සංවිධාන නියෝජිතයන් සය දෙනෙකු සහ ඉහත එක් එක් කමිටු සඳහා තේමාත්මක විශේෂඥයන් දෙදෙනෙකු සඳහා වෙන් කර ඇති පුරප්පාඩු පිරවීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නාම යෝජනා කැඳවනු ලබයි.

- සියලුම නාමයෝජනා ලිඛිතව තිබිය යුතු අතර එය සමග (a) a අපේක්ෂකයාගේ කැමැත්ත සඳහන් ලිපියක් සහ (b) අපේක්ෂකයාගේ විස්තර ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක් ද එවිය යුතු වේ.

- එක් පුද්ගලයෙකු එක් උප කමිටුවකට වඩා නම් නොකළ යුතු වේ.

- සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් සඳහා වෙන් කර ඇති පුරප්පාඩු පිරවීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමේ දී අදාළ තේමා පාඨයන්ට අනුව ක්‍රියාකරන පිළිගත් සිවිල් සමාජ සංවිධානයක ලිපි ශීර්ෂය සහිතව නාමයෝජනා ඉදිරිපත් කළ යුතු අතර එය සංවිධානයේ ප්‍රධානියා විසින් අත්සන් කළ යුතු වේ. එසේම එක් සංවිධානයකින් එක් උප කමිටුවක් සඳහා එක් නාම යෝජනාවකට වැඩි ප්‍රමාණයක් නම් නොකළ යුතුය. (එනම් එක් සංවිධානයකින් එක් උප කමිටුවක් සඳහා එක් අයෙකුට වඩා නම් කළ නොහැකි නමුත් උප කමිටු සඳහා වෙන් වෙන් වශයෙන් පුද්ගලයින් නම් කළ හැකිය.)

- තේමාත්මක විශේෂඥයින් සඳහා වෙන් කර ඇති පුරප්පාඩු පිරවීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමේ දී සෑම නාමයෝජනාවක්ම අදාළ තේමාවන්ට අනුව ක්‍රියාකරන සිවිල් සමාජ සංවිධාන තුනක ප්‍රධානීන් විසින් අත්සන් කර අනුමත කරගත යුතුය.

නාමයෝජනා ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින්ගේ පළපුරුද්ද සහ ප්‍රවීණත්වය සැළකිල්ලට ගනිමින් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අවසන් සංයුතිය තීරණය කරනු ලබයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, කලාපීය නියෝජනය, වයස සහ ආබාධිත තත්ත්වය යන අංග අනුව එක් එක් උප කමිටු සංයුතියේ සමතුලිතාවය සහතික කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාව උත්සාහ දරයි. සාධාරණ හේතූන් මත ඕනෑම උප කමිටුවක සමාජිකත්වය අත්හිටුවීමේ බලය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඇත.

නාමයෝජනා මෙම විද්‍යුත් ලිපිනය වෙත chair.hrcsl@gmail.com යොමු කර පිටපත rm.director.hrcsl@gmail.com වෙත යොමු කරන්න.

නාමයෝජනා එවීමට ඇති අවසන් දිනය 31 මැයි 2024. වේ.

**ක්‍රියාත්මක වීම සම්බන්ධ වන කොන්දේසි**

උප කමිටුවලට අදාළ ආශ්‍රිත නාමාවලිය පහත පරිදි වේ.

**එක් එක් තේමාවන්ට අදාළ නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ නිල භාවිතයන් සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සම්බන්ධව මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දීම සහ ඒ සම්බන්ධ සිය ප්‍රතිපත්ති නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රජය වෙත ලබා දීම.**

**එක් එක් තේමාවන්ට අදාළව අධ්‍යාපනය සහ දැනුවත් කිරීම ලබා දීමට මානව හිමිකම් කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීම.**

**එක් එක් තේමාවට අදාළව මූලික පර්යේෂණ පැවැත්වීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂණ් සභෘව වෙත උපදෙස් ලබා දීම හා සහාය ලබා දීම.**

**එක් එක් තේමාවන්ට අදාළව ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණය වෙත ඉදිරිපත් කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීම.**

මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී සෑම කාර්තුවකටම එක් වරක් උප කමිටුව රැස්වීමට නියමිත අතර අවශ්‍යතාවය මත කොළඹින් පිටත සාමාජිකයන්ට සහභාගීවීමට හැකි වන පරිදි මිශ්‍ර ක්‍රමවේදයකට ( මාර්ගගත ක්‍රමය ද ඇතුළත්ව) වුවද පැවැත්වීමට කටයුතු කරයි.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2024.05.01.